# 19 සසුන රැකුමට ගැනුණු පියවර

බුද්ධශාසනය පිළිබඳ ඉතිහාසය ඉතා දිග ය. සියවස් විසිපහකටත් වැඩි එම දීර්ඝ ඉතිහාසය තුළ සුපිරිසිදු ථෙරවාදී ධර්ම විනය දිවි හිමියෙන් ඇප කැප වී ආරක්ෂා කිරීමේ පරම ගෞරවය හිමිවන්නේ අතීතයේ වැඩසිටි ශාසනමාමක, සුපේශල ශික්ෂාකාමී බුද්ධ පුත්‍රයන් වහන්සේලාට ය. විවිධාකාර වූ බාහිර හා අභ්‍යන්තර බලපෑම් තුළින් ඉපැරණි පෙළ දහමට හෙවත් ත්‍රිපිටක බුද්ධවචනයට සිදු විය හැකිව තිබූ අනතුරු වළක්වා ගනිමින්, එය නොයෙකුත් ආකාරයේ දුර්මතවලින් කිළිටි වනු නො දී ආරක්ෂා කර ගැනීම පිණිස වෙසෙසින් ම උපකාරී වූ ඓතිහාසික මහා ධර්ම ශාස්ත්‍රීය සම්මේලන මාලාව ධර්ම සංගායනා ලෙස හැඳින්වෙයි. ධර්මධර විනයධර මහරහතන් වහන්සේලා ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා එක්රැස් ව සැබවින් ම බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය කුමක් ද? එහි ලා කුමන සූත්‍ර දේශනාවන් කෙසේ වදරන ලද්දේ ද? කුමන විනය ශික්ෂාවන් කෙසේ පනවන ලද්දේ දැයි සාකච්ඡා කොට පැහැදිලි සාමූහික එකඟතාවකට පත්වීම සංගායනාවල දී සිදු විය.


බුද්ධවචනය මුඛ පරපුරින් පවත්වා ගෙන යමින් නිර්මල ව රැක ගැන්මටත් එය ධාරණය කිරීමට, ඉගෙනීමට, ඉගැන්වීමට හා දේශනා කිරීමටත් එම ක්‍රියා මාර්ග මහත් පිටිවහලක් විය.

බුදුරජාණන් වහන්සේ විසින් ම උන්වහන්සේගේ ජීවිතය අවසාන භාගයේ දී ආනන්ද මාහිමියන් විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ''ආනන්ද මාවිසින් යම් ධර්මයක් දෙශනා කරන ලද නම් විනයක් පනවන ලද ද ඒ ධර්ම විනය ම මාගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වන්නේ යැ යි'' වදාරන ලද බව පෙළ දහමෙහි ම සඳහන් වෙයි.

ඒ අනුව බුද්ධපරිනිර්වාණයෙන් පසු ව සිය ආචාර්යවරයා හෙවත් ශාස්තෘවරයා වූ ඒ උතුම් ධර්ම විනය නිර්මල ව හා විධිමත් ව රැකගැන්මේ වගකීම ශාසන භාරධාරී මහ තෙරුන්වහන්සේලා මැනවින් ඉටු කළ ආකාරය සංගායනා තුළින් දැක ගත හැකි වෙයි. පසුකාලීන ව පාළි ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම ද එහි ප්‍රතිඵලයකි. එම අද්විතීය ධර්ම ශාස්ත්‍රීය මෙහෙවර නිසැකව ම ථෙරවාදී ධර්ම විනය සුපිරිසිදු ව අද වන තුරු රැක ගැන්ම පිණිස උපකාරී වූයේ ය. මතුවට ද උපකාර වන්නේ ය.

බුද්ධශාසනය පිළිබඳ දීර්ඝ ඉතිහාසය තුළ විටින් විට විවිධ විසම අදහස් හා ආකල්ප ඇති භික්ෂූහු බිහිවූහ. ඇතැම් විට ඔවුහු භික්ෂූ වෙස් ගත් අන්‍යමතධාරී අබෞද්ධයෝ වූහ. ඔවුන්ගෙන් නිර්මල ථෙරවාදය රැක ගැනීම ද කලින් කල ඇති වූ අවශ්‍යතාවකි. එ සේ ම බුද්ධවචනය විවිධාකාරයෙන් විකෘති වන පරිදි අර්ථ විග්‍රහ කළ ශ්‍රාවක පිරිස් ද බුද්ධවචනයට විවිධ දුර්මත එක් කළ බෞද්ධ හා අබෞද්ධ පිරිස් ද විටින් විට ඇති විය. බුදුරදුන් වදාළ ධර්ම විනය වෙනස් කොට සිය අභිමතය පරිදි ප්‍රකාශ කිරීම ට යොමු වූ එ බඳු පුද්ගලයන් හා කණ්ඩායම් නිහඬ කිරීමටත් ඔවුන්ට නිසි පිළිතුරු දීමටත් විටෙක ඔවුන් මේ සසුනින් නෙරපා දැමීමටත් සංගීතිකාරක තෙරුන් වහන්සේලා ක්‍රියා කළහ.

ආදී අවස්ථාවේ පටන් ම ''**විනය සසුනෙහි ආයුෂය වන බවත් විනය පවත්නා කල්හි ම සසුන පවත්නා බවත්**'' ජ්‍යෙෂ්ඨ ථෙරවාදී භික්ෂූන් වහන්සේලා වටහා ගෙන සිටි බවට මූලාශ්‍රය සාක්ෂි දරයි. ඒ අනුව විනයගරුක ශික්ෂාකාමී භික්ෂු පරපුරක් ලෙස ථෙරවාද භික්ෂු පරපුර නිර්මල ව රැක ගැනීම කෙරෙහි දිගින් දිගට ම අවධානය යොමු වී තිබේ. ඉතිහාසයේ විවිධ අවස්ථාවල භරතයෙහි ද ශ්‍රී ලංකාවේ ද භික්ෂු විනය පිරිහී ගිය විට ශාසන භාරධාරීහු වහා ක්‍රියාත්මක වූහ. ඉතා වැදගත් ඵලදායක පිළියම් ද යෙදූහ. ධර්මසංගායනා තුළින් එම මෙහෙවර වෙසෙසින් ම ප්‍රකට වෙයි. විනයෙන්, ශීලයෙන් පිරිහුණු භික්ෂූහු එම සම්මේලනවල දී ඒකමතික ව සසුනින් බැහැර කරන ලදහ. ඒ හේතුවෙන් ම ථෙරවාදී භික්ෂු සම්ප්‍රදාය අද දක්වාත් බරපතල වෙනස්කම්වලට ලක් නොවූ පෞරාණික ශාසනික සම්ප්‍රදාය ලෙස ලෝකයාගේ සම්භාවනාවට ලක් ව ඇත.



ථෙරවාද බෞද්ධ ඉතිහාසය තුළ භාරතයේ දී පවත්වන ලද ධර්මසංගායනා තුනක් ගැන ද ලක්දිව දී පවත්වන ලද සංගායනා කිහිපයක් ගැන ද තොරතුරු සඳහන් වෙයි. ඉහත දක්වන ලද ආකාරයෙන් පාලි ත්‍රිපිටක ධර්මයත්, ථෙරවාදී භික්ෂු සම්ප්‍රදායයත් ආරක්ෂා කොට පවත්වා ගෙන යාම පිණිස එම සංගායනා මගින් සිදු වූ සුවිශේෂ කාර්යයන් රාශියකි.

## පළමු සංගායනාවෙන් ගත් පියවර

සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසු රජගහනුවර සප්තපර්ණී ගුහා ද්වාරයේ දී පැවැත් වූ ප්‍රථම ධර්මසංගායනාව ආකාර කිහිපයකින් ම ශාසන සංරක්ෂණයට දායක වූයේ ය.

- බුදුරදුන් ධරමාන අවදියේ පටන් ම විසූ දුර්මතධාරී භික්ෂූන් නිසා සසුනට සිදු විය හැකි ව තිබූ අයහපත වළක්වා ගැනීමට කටයුතු කිරීම. විශේෂයෙන් බුද්ධ පරිනිර්වාණය සිදු වූ අවස්ථාවෙහි "ඇවැත්නි, නොහඬව්, නොවැළපෙව්, අපි ඒ මහාශ්‍රමණයාගෙන් මැනැවින් මිදුණෝ වෙමු" යි සාහසික අභද්‍ර වචන පළ කළ **සුභද්‍ර** වැනි භික්ෂූන් නිහඬ කිරීමට හැකි විය.

- බුදුරජාණන් වහන්සේ විසින් ධර්මය දේශනා කරන ලද්දේ ද විනය පනවන ලද්දේ ද අවස්ථානුකූල ව ය. අවශ්‍යතාව හෝ මතු වූ ගැටලුව අනුව ය. එබැවින් අධ්‍යාපන අධ්‍යයන අවශ්‍යතා අනුව ධර්ම විනය ගොනු වී නො තිබිණ. විසිරුණු මල් ගොඩක් මෙන් පැවති බව සඳහන් වන ධර්ම විනය විධිමත් ව ගොනු කරලීම අවශ්‍ය වූයේ ය. ඒ අනුව සූත්‍ර දේශනාවන් සමූහය හෙවත් ධර්මය නිකාය වශයෙන් පහකට වෙන් කරන ලද්දේ ය.

1. **දීඝ නිකාය**
2. **මජ්ඣිම නිකාය**
3. **අංගුත්තර නිකාය**
4. **සංයුත්ත නිකාය**
5. **ඛුද්දක නිකාය යනුවෙනි.**

නිකාය යනු සමූහය යි. කොටස යි. එකතුව යි. ප්‍රමාණයෙන් දික් වූ සූත්‍ර එකතුව දීඝ නිකාය නමින් ද, මධ්‍යම ප්‍රමාණ වූ සූත්‍ර එකතුව මජ්ඣිම නිකාය නමින් ද, සංඛ්‍යාත්මක ව අංකයෙන් අංකය වැඩිවන සේ කරුණු වදළ සූත්‍ර එකතුව අංගුත්තර නිකාය නමින් ද, එකිනෙකට සම්බන්ධ වූ ගෙතු ධර්ම කරුණු ඇතුළත් සූත්‍ර එකතුව සංයුක්ත නිකාය නමින් ද, කුඩා ප්‍රමාණයේ දේශනා එකතුව ඛුද්දක නිකාය නමින් ද හැඳින්වෙයි. මෙ සේ ප්‍රථම සංගීතියේ දී සංග්‍රහ කරන ලද බැවින් දික් සඟිය, මැදුම් සඟිය, අංගුත්තර සඟිය, සංයුත් සඟිය හා කුදුගොත් සඟිය ලෙස ද හඳුන්වනු ලැබේ. එසේ ම පවත්වා ගෙන එන, පිළිගත් යන අර්ථයෙන් දීඝාගම, මජ්ඣිමාගම, අංගුත්තරාගම, සංයුත්තාගම, ඛුද්දකාගම යනුවෙන් ද ව්‍යවහාර වෙයි. මෙම සැලසුම මේ අයුරින් ම නොවෙනස් ව අද දක්වාම පවතී. අපි මෙම කොටස් පහ එක් කොට සූත්‍ර පිටකය යැයි කියමු. ප්‍රථම සංගීතියේ දී මහතෙරුන් වහන්සේලා විසින් ධර්මය යන තේමාව යටතේ ම අභිධර්මය ද සංගායනා කළ බව ඇතැම් විද්වතුන් ගේ පිළිගැනීම යි.

- පළමුවැනි සංගායනාවේ දී විනය ද පස් ආකාරයකින් සංග්‍රහ කරන ලදී.

1. **පාරාජික පාලි**
2. **පාචිත්තිය පාලි**
3. **චුල්ලවග්ග පාලි**
4. **මහාවග්ග පාලි**
5. **පරිවාර පාලි** යනුවෙනි.

විනය පිටකය ලෙස හැඳින්වෙන මෙම මූලාශ්‍රවල ඇතුළත්වන්නේ උපසම්පදා භික්ෂූන් වහන්සේලාට අදාළ විනය ශික්ෂාවන් හා පාලන ක්‍රමය යි. සුත්ත විභංග යනුවෙන් ද හැඳින්වෙන පාරාජිකා පාලිය හා පාචිත්තිය පාලිය තුළ උපසපන් භික්ෂූන් වහන්සේලාට අදාළ ශික්ෂා ප්‍රඥප්ති ද, ඛන්ධක ලෙස ද හැඳින්වෙන චුල්ලවග්ග පාලිය හා මහාවග්ග පාලිය තුළ සංඝ සමාජයේ පැවැත්මට උපසපන් භික්ෂූන් සාමූහිකව කළ යුතු දේ හා බැඳුණු පැනවීම් ද පරිවාර පාලියෙහි එම භික්ෂූන්ගේ පෞද්ගලික හා සාමූහික යන දෙඅංශයට ම අදාළ වෙනත් පැනවීම් ද ඇතුළත් ය.

- ප්‍රථම සංගීතියේ දී සසුනෙහි සුරක්ෂිත බව අරමුණු කොට ගත් තවත් වැදගත් පියවරක් වන්නේ ධර්ම විනය මුඛ පරපුරින් රැකගෙන ඉදිරියටත් ගෙන යාම උදෙසා භාණක පරම්පරා නියම කිරීම යි. ඒ අනුව,

| | |
|---|---|
| **දීඝ නිකාය** | ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද |
| **මජ්ඣිම නිකාය** | සැරියුත් තෙරුන් ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද |
| **අංගුත්තර නිකාය** | අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද |
| **සංයුක්ත නිකාය** | කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද |
| **ඛුද්දක නිකාය** | සියලු භික්ෂූන් වහන්සේලාට ද පැවරිණි. |

මෙම ක්‍රියාමාර්ගය නිසා පසුව ලක්දිව දී ග්‍රන්ථාරූඪ කරනතුරුත් එතැන් පටන් අද දක්වාත් ලෝකයේ පැරණි ම පාලි ත්‍රිපිටක ග්‍රන්ථ සුරක්ෂිත ව පවතී යි. එහිදී,

- විනය පිටකය- උපාලි තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට පැවරිණි.

  "මාගේ ඇවෑමෙන් භික්ෂූන් ගේ එකඟතාව මත ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද වෙනස් කර ගත හැකි යැ"යි බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන තිබිණ. ඒ අනුව එකී කුඩා අනු කුඩා ශික්ෂා පද කවරේ දැ යි තීරණය කිරීමේ ගැටලුව ද ප්‍රථම සංගායනාවේ දී මතු විය. එහෙත් අවස්ථාවේ හැටියට එය නොකළ යුතු ය. එ සේ කළහොත් බුදුරදුන් පිරිනිවී නොබෝ කලකින් ම සංඝයා විනය නීති වෙනස් කරතැ'යි මහජනයාගෙන් චෝදනාවක් එල්ල විය හැකි යැයි සලකා එසේ වෙනස් නොකිරීමට තීරණය කෙරිණ. එය ද ශාසන චිරස්ථිතිය ගැන සිතා මතා ම ගත් තීරණයක් බව පෙනේ.

## දෙවන සංගායනාවෙන් ගත් පියවර

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසුව විසාලා නුවර වාලුකාරාමයේ දී පැවැත් වූ දෙවැනි ධර්මසංගායනාව ද ථෙරවාද බුදු සමය හා භික්ෂු පරපුර ආරක්ෂා කොට සංවිධානය කරමින් පවත්වා ගෙන යාමට ඉවහල් විය. ඊට අදාළ පියවර කිහිපයක් එහිදී ද ගන්නා ලදී.

- කුඩා අනුකුඩා ශික්ෂා පද සම්මුතිය අභිබවා යමින් වජ්ජිපුත්තක භික්ෂූන් සම්මත කොට ගත් දස අකැප වස්තු පාචීනක හා පාවෙය්‍යක යන දෙපාර්ශ්වයට ම අයත් භික්ෂූන්ගෙන් සමන්විත කමිටුවක් විසින් සලකා බලන ලදුව ඒවා ධර්ම විනයට අනුකූල නොවන බව තීරණය කිරීම එක් පියවරකි.

- ශාසන භාරධාරී මහ රහතන් වහන්සේලා ප්‍රධාන ථෙරවාදී භික්ෂූන් විනය සසුනෙහි ආයුෂය වේ. " යන සිය පිළිගැනීම අනුව දසවස්තුව අකැප බව ප්‍රකාශයට පත් කරමින්, යළිත් වරක් ථෙරවාද විනය දුර්මතධාරීන්ගෙන් බේරාගෙන නිරවුල් ව, පිරිසිදු ව පවත්වා ගෙන යාමට ක්‍රියා කිරීම තවත් පියවරකි.

- දුර්මතධාරී ව අකැප දසවස්තුව පිළිගත් වජ්ජි පුත්තක භික්ෂූන් දස දහසක් සසුනින් ඉවත් කර ලීමෙන් ශාසන ශෝධනයකට පියවර ගැනීම ද මෙහි දී සිදු විය. එ මගින් ථෙරවාදී ධර්ම විනය ගරු කරන භික්ෂූන්ට පවිත්‍ර ව සිය පරපුර පවත්වා ගෙන යාමට හැකි විය.

- වඩාත් පැරණි, නිර්මල ධර්ම විනය ගරු කළ භික්ෂු පරපුර වශයෙන් ථෙරවාදය වෙන ම සම්ප්‍රදායක් ලෙස සංවිධානය වීමේ පළමු පියවරට එළඹීම ද මෙහිදී සිදු විය. දස වස්තුව පිළිගත් බැවින් සසුනින් නෙරපන ලද භික්ෂූන් වෙන් ව ගොස් මහා සංඝික නිකාය පිහිටුවාගත් අතර එතැන් පටන් මහාකාශ්‍යපාදි මහ තෙරුන් වහන්සේලාගේ පරපුර ථෙරවාදය නමින් පෙනී සිටියේ ය.

## තෙවන සංගායනාවෙන් ගත් පියවර

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු පැළලුප් නුවර අශෝකාරාමයේ දී පවත්වන ලද තෙවැනි ධර්මසංගායනාවේ දී ද මෙ ලෙසින් ම ශාසන චිරස්ථිතියට අදාළ පියවර රැසක් ගන්නා ලදී.

- සැට දහසක් වූ අධර්මවාදීන් සසුනින් නෙරපා ශාසන ශෝධනයක් ඇති කිරීම සඳහා මෙම සංගායනාව ඉවහල් විය. ප්‍රත්‍ය ලාභය පිණිස මෙම භික්ෂූහු සසුන්ගත ව සිටියහ. ඔවුන්ගෙන් අනාගතයේ දී සසුනට විය හැකි හානිය දැක මෙ ලෙස නෙරපා හැරීම සසුනේ චිරස්ථිතියට බලපෑ වැදගත් කරුණකි.

- පරවාද පන්සියයක් හා ඒවා ඛණ්ඩනය කිරීම සඳහා, සකවාද පන්සියයක් ඇතුළත් **කථාවත්ථුප්පකරණය** නම් ග්‍රන්ථය **මොග්ගලීපුත්ත තිස්ස** මහතෙරණුවන් විසින් සම්පාදනය කොට අභිධර්ම පිටකයට එක් කරන ලදී. එ මගින් ථේරවාද අභිධර්ම පිටකය ප්‍රකරණ සතකින් යුක්ත ව සම්පූර්ණ විය.

- සුසිල්වත් භික්ෂූන් වහන්සේලාට නැවත පොහොය කර්මාදිය සිදු කිරීමට ඉඩ සැලසුණේ ද මෙම ධර්ම සංගායනාවෙන් පසුවයි. භික්ෂු ප්‍රතිරූපකයන් සසුනෙහි සුලභ වීමෙන් සත් වසරක් පොහොය කර්ම නොකළ සුසිල්වත් භික්ෂූහු මෙතැන් පටන් බුදුරදුන් අනුදත් පරිදි අඩ මසකට වරක් ප්‍රාදේශීය වශයෙන් රැස් ව පොහොය කිරීමට පටන් ගත්හ.

මහාධිරාජ **ධර්මාශෝක** රජතුමන්ගේ ධර්ම විජය ප්‍රතිපත්තිය අනුව ථෙරවාද බුදු දහම දේශ දේශාන්තරයන්හි ව්‍යාප්ත කිරීමේ කටයුතු සිදු වූයේ ද මෙම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි. එ මගින් එම රටවල ජනයාට ද බුදු දහමේ ආශීර්වාදය ලැබිණි. එ සේ දූත කණ්ඩායම් මගින් ධර්මය ප්‍රචාරය කළ රටවල් නවයකි.

| | ප්‍රදේශය | නායකත්වය | ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය හෝ කථා වස්තුව |
|---|---|---|---|
| 1. | කාශ්මීර ගන්ධාරය | මජ්ඣන්තික තෙරුන් වහන්සේ | ආසිවිසෝපම සූත්‍රය |
| 2. | මහිස මණ්ඩලය | මහාදේව තෙරුන් වහන්සේ | දේවදූත සූත්‍රය |
| 3. | වනවාසී දේශය | රක්ඛිත තෙරුන් වහන්සේ | අනමතග්ග සූත්‍රය |
| 4. | අපරන්ත දේශය | යෝනක ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ | අග්ගික්ඛන්ධෝපම සූත්‍රය |
| 5. | මහාරට්ඨ | මහාධම්මරක්ඛිත තෙරුන් වහන්සේ | මහානාරද කස්සප ජාතකය |
| 6. | යෝනක රට්ඨ | මහාරක්ඛිත තෙරුන් වහන්සේ | කාලකාරාම සූත්‍රය |
| 7. | හිමවන්ත ප්‍රදේශය | මජ්ඣිම තෙරුන් වහන්සේ | ධම්මචක්කප්පවත්තන සූත්‍රය |
| 8. | ස්වර්ණභූමිය | සෝණ උත්තර යන තෙරුන් වහන්සේලා | බ්‍රහ්මජාල සූත්‍රය |
| 9. | තම්බපණ්ණිය (ශ්‍රී ලංකාව) | මිහිඳු මහ රහතන් වහන්සේ | චූල්ලහත්ථි පදෝපම සූත්‍රය |

## රටවල් නවයට ධර්ම දූතයින් යැවීම පිළිබඳ මහාවංස වාර්තාව

ථේරෝ මොග්ගලිපුත්තෝ සෝ ජිනසාසනජෝතකෝ,
නිට්ඨාපෙත්වාන සංගීතිං පෙක්ඛමානෝ අනාගතං.
සාසනස්ස පතිට්ඨානං පච්චන්තේසු අවෙක්ඛිය,
පේසේසි කත්තිකේ මාසේ තේ තේ ථේරේ තහිං තහිං.

ථේරං කස්මීරගන්ධාරං මජ්ඣන්තිකමපේසයි,
අපේසයි මහාදේවත්ථේරං මහිසමණ්ඩලං.

වනවාසිං අපේසයි ථේරං රක්ඛිතනාමකං,
තථාපරන්තකං යෝනධම්මරක්ඛිත නාමකං.

මහාරට්ඨං මහාධම්මරක්ඛිතත්ථේරනාමකං,
මහාරක්ඛිත ථේරං තු යෝනලෝකමපේසයි,

පේසේයි මජ්ඣිමං ථේරං හිමවන්තපදේසකං,
සුවණ්ණ භූමිං ථේරේ ද්වේ සෝණමුත්තරමේව ච.

මහාමහින්දථේරං තං ථේරංඉට්ඨියමුත්තියං,
සම්බලං භද්දසාලඤ්ච සකේ සද්ධිවිහාරිකේ.

'ලංකාදීපේ මනුඤ්ඤම්හි මනුඤ්ඤං ජිනසාසනං,
පතිට්ඨාපේථ තුම්හේ' තිපඤ්ච ථේරේ අපේසයි.

මහාවංස, ද්වාදසම පරිච්ඡේද 1,2,3,4,5,6,7,8 ගාථා

## අලුවිහාර සංගායනාවෙන් ගත් පියවර

තෙවන ධර්ම සංගීතියේ ප්‍රතිඵලයක් වශයෙන් එවකට තම්බපණ්ණි නම් වූ ශ්‍රී ලංකාවට බුදුදහම ලැබුණු බව අපි දනිමු. ථෙරවාද බුදුදහම මුල් බැස ගත් පැරණි ම දේශය වූයේ ශ්‍රී ලංකාව යි. එහි අතීත නරපතියන්ගේ අනුග්‍රහය ඇති ව මහාවිහාරවාසී මහතෙරවරු ඉමහත් කැපවීමකින් මෙ රට සම්බුදු සසුන රැක ගත්හ.

දිගු කලක් තිස්සේ යුද කලි කලහ, දුර්භික්ෂාදිය ද මැදින් දිවි හිමියෙන් සසුන රැක ගත් මෙරට භික්ෂූන් වහන්සේ විසින් වළගම්බා රජු දවස මාතලේ අලු විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලදී. එය ලක්දිව දී සිදු වූ ත්‍රිපිටක සංගායනාව ලෙස හැඳින් වෙයි. එ මගින් සිදු වූ ශාසනික සේවාව ද ඉමහත් ය.

- ත්‍රිපිටක බුද්ධවචනය පෞරාණික ස්වරූපයෙන් ම, මුල් තත්ත්වයෙන් ම තව දුරටත් සුරක්ෂිත වීම, මුඛ පරපුරින් පවත්වාගෙන යාමේ දී විවිධ හේතු නිසා ත්‍රිපිටක ධර්මයට සිදු විය හැකි හානි වළක්වා ගත හැකි වීම.

- **නිර්මල ථෙරවාද පාලි ත්‍රිපිටකයට විවිධ මති මතාන්තර එක් වීමට හා එහි එන ඉගැන්වීම් විකෘති වීමට ඇති අවස්ථාව නැති වී යාම. අද වන විට මුද්‍රණය වී ඇත්තේ ද මෙම ත්‍රිපිටක ධර්මය ම වේ.**

- **දැනට ලෝකයේ පැරණි හා නූතන භාෂා රැසකින් ම විවිධ දේශයන්හි දී ත්‍රිපිටකය ලියා ඇති නමුදු වඩාත් ම පැරණියැ යි ද වඩාත් ම පිරිසිදු යැ යි ද විද්වතුන් පිළිගන්නා පාලි තුන් පිටකය සුරක්ෂිත බවට පත් වීම.**

**මෙසේ භාරතය තුළත් ශ්‍රී ලංකාව තුළත් පවත්වන ලද ඉහත කී ධර්ම සංගායනාවන් නොවන්නට මේ වන විට ආදී බුද්ධ වචනය අභාවයට යාමට ද එය විවිධාකාරයෙන් විකෘතිවීමට ද ඉඩ තිබිණි. එ බැවින් එහි අගය දැන සසුන සුරැකීමට මතුවට ද කළ හැකි දේ කිරීමට අපි ද අදිටන් කර ගනිමු.**

## සාරාංශය

දඹදිව දී සිදු වූ මුල් සංගායනා තුනත් ලක්දිව දී සිදු වූ අලුවිහාර සංගායනාවත් නිසා එක් අතෙකින් ත්‍රිපිටක බුද්ධවචනය නිර්මලව ආරක්ෂා කර ගැන්මට හැකි විය. අනෙක් අතින් එයට දුර්මත එක් වීමෙන් විය හැකි හානි වළක්වා ගත හැකි විය. එසේ ම ථෙරවාද භික්ෂු සම්ප්‍රදාය හා එහි විනයවත් බව තහවුරු කොට පවත්වා ගැන්මට ද අවස්ථාව උදා විය. අද වන තුරුත් ථෙරවාද ධර්ම විනය හා භික්ෂු සම්ප්‍රදාය සුරැකී පවත්නේ එම සංගායනාවල දී ගත් උදාර පියවර හේතුවෙනි.

## ක්‍රියාකාරකම්

01. ප්‍රථම ධර්මසංගායනාව ශාසනික වශයෙන් වැදගත් යැයි ඔබ පිළිගන්නේ කවර කරුණු අනුව දැ යි පැහැදිලි කරන්න.

02. තෙවැනි සංගායනාව ථෙරවාද බුදුදහමේ ව්‍යාප්තියට බෙහෙවින් ම උපකාරී වූ අයුරු පැහැදිලි කරන්න.

03. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් බෞද්ධ ලෝකයට සැලසුන සෙත විස්තර කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් සපයන්න.

04. සම්බුද්ධශාසනයේ චිර පැවැත්ම පිණිස ඔබට කළ හැකි දේ මොනවා දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

## පැවරුම

01. පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට සුදුසු වන පරිදි තුන් පිටකයේ මූලික සැලැස්ම දක්වෙන වගුවක් සකස් කරන්න.

වැරදි කළ අය හට
දඬුවම් දෙන්නේ හැදුමට
හැදෙන අය එම විට
හොඳින් කීකරු වෙති නැමී සිට

සිරිත් මල්දම